# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 ජුනි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2016 ජුනි මාසය සඳහා වාර්ෂික උද්ධමනය 6.4% ලෙස ගණනය කොට ඇති බව ප්‍රකාශ කලේය. උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 3.4% ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.1% ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. මේ සඳහා 2% ක සැළකියයුතු දායකත්වයක් ආහාර කාණ්ඩයේ එළවළු සහ අමු මිරිස් වලින් ලැබී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) 2015 ඔක්තෝම්බර් මස සිට අදාල ලිත් මාසය අවසන් වී 21 වන දින ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 ජුනි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 116.1 ලෙස ගණනය කර ඇත. ජුනි මාසයේ දර්ශකය මැයි මාසයේ දර්ශකය (113.7) හා සංසන්දනය කල විට 2.4ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 2.1ක වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 2.1% කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.1% කින් වැඩිවීම බලපා ඇත. ආහාර කාණ්ඩයේ මාසික වැඩිවීම සඳහා එළවළු සහ අමු මිරිස්වල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.

2016 මැයි මාසය හා සසඳන කල 2016 ජුනි මාසය සඳහා ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 2.1%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම වැඩිවීම සඳහා එළවළු, අමු මිරිස්, සහල්, අළුත් මාළු, සීනි, අර්තාපල්, රතුළූණු, මයිසූර් පරිප්පු, පොල්තෙල්, කරවල සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් දෙහි, පොල්, සියඹලා සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

2016 මැයි මාසය හා සසඳන කල 2016 ජුනි මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.1%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘ආපනශාලා හා හෝටල්’, ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන’, ‘විවිධ භාණ්ඩ හා සේවා’, ‘රෙදිපිළි හා පාවහන්’ සහ ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු’ යන කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේම පසුගිය මාසය (මැයි) හා සසඳන කල ‘සන්නිවේදන’ කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ යන කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇත. ‘සෞඛ්‍ය’, ‘ප්‍රවාහන’, ‘විනෝදාත්මක හා සංස්කෘතික’ සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2015** | ජුනි | 109.1 | 1.0 | 2.7 |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 |
| | ඔක්තෝම්බර් | 109.2 | 0.7 | 3.0 |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020